**ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල - 2014**

---------------------------------------

ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අගෝස්තු 24 දිනැති අංක 3/136 දරන භාර ඔප්පුවේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් සේවායෝජකයින් වෙත අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද රු.2,162,680 ක් වටිනා ඇප බැඳුම්කර ඉදිකිරීම් සේවායෝජකයින් විසින් මුදල් කිරීම නිසා අරමුදලට වූ පාඩුව අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා ණයගැති ගිණුම්වලට හර කිරීම වෙනුවට ආදායමට එරෙහිව කපා හැර තිබුණි. ඉකුත් වර්ෂ දෙක තුළදීද මෙසේ කපා හළ මුදල රු.20,466,700 ක් විය.

(ආ) බාහිර සේවා පදනම මත සේවයේ යොදවා ඇති නිලධාරින් වෙනුවෙන් වැටුප්, වේතන හා වෙනත් දීමනා වශයෙන් ගෙවා තිබුණු රු.16,147,431ක් පර්යේෂණ හා සංවර්ධන වියදම් වශයෙන් වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

(ඇ) පෙර වර්ෂයන්හි විගණන ගාස්තු රු.352,810 කින් අඩුවෙන් දක්වා තිබීම හා ඇපකර ආදායම් රු.1,760,784 කින් වැඩියෙන් දක්වා තිබීම නිවැරදි කිරීම සඳහා පෙර වර්ෂ ගැලපුම් ගිණුමට හර කර තිබූ නමුත් අතීතානුයෝගී ලෙස ගිණුම් නැවත සකස් කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂවලට අදාල වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර රු.2,113,594 ක මුදලක් ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 2006 ජූලි 14 දිනැති අංක පීඊඞී 38 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල එකතු කළ අගය මත බදු සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණු අතර උපයනවිට ගෙවීම් බද්දට යටත් නිලධාරීන්ගෙන් බදු අයකර නොතිබුණි. |
| (ඇ) 2005 අගෝස්තු 24 දිනැති අංක 3/136 දරන භාර ඔප්පුවේ 7 වගන්තිය | අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපති හෝ භාරකරුවන් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් ඒ සඳහා දරන ලද වියදම් |

ප්‍රතිපූර්ණය කර ගැනීමක් මිස තමන් විසින් සලසන සේවය සඳහා කිසිදු දීමනාවක් අරමුදලෙන් ලබා ගැනීමට ඔවුන්ට හිමිකම් නොමැති වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් සභාපති දීමනා හා භාරකාර මණ්ඩල රැස්වීම් දීමනා ලෙස එකතුව රු.3,902,100 ක් ලබා ගෙන තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.133,519,853 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 148,186,101 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,666,248 ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඇප බැඳුම්කර ආදායම් සහ ස්ථාවර තැන්පතු ආදායම් අඩුවීම ඊට ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ගිණුම් සකස් කිරීම බාහිර සේවා පදනමින් ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනයේ නිලධාරීන් 17 දෙනෙකු විසින් සිදුකරනු ලබන අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන්ට රු.1,206,258 ක් ගෙවා තිබුණි. මේ සඳහා 1999 මැයි මාසයේ පවත්වා තිබූ භාරකාර මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ කළමනාකරණ තීරණ අංක 99-05-3.1 අනුව උක්ත නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට තීරණය කර තිබුණද ඒ සඳහා ඔවුන්ට කිසිදු ආකාරයක පත්වීම් පිරිනැමීමක් හෝ සේවා ගිවිසුම්වලට එළැඹීමක් නොතිබූ බැවින් එම ගෙවීම්වල විධිමත්භාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අරමුදලට ලැබුණු රු.765,411,739 ක මුදලක් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඇ) අරමුදල විසින් නිකුත් කළ හැකි ඇපකර වටිනාකමේ උපරිම සීමාව අදාළ කාලපරිච්ඡේදයේ අරමුදලේ හිමිකම් මෙන් දස ගුණයක් බව 2012 පෙබරවාරි 08 දිනැති සංශෝධිත භාර ගිවිසුමේ දක්වා තිබුණ නමුත් ඒ සඳහා අරමුදලේ බේරුම්කරු වන භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව දැනට පවතින ඇපකර සීමාවේ නීත්‍යානුකූල බව විගණනයට තහවුරු නොවිණි.

(ඈ) ආයතනයේ උපදේශක තනතුර දරන නිලධාරි වෙත ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.60,000 ක මාසික කුලී පදනම මත ලබාගත් වාහනය වෙනුවෙන් රු.810,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දෙවන මාස 06 සඳහා එහි මාසික කුලිය රු.75,000 ක් දක්වා වැඩිකර තිබුණ ද ඒ සම්බන්ධයෙන් කුලී ගිවිසුමේ කිසිම සඳහනක් නොවිය. ඒ අනුව මාසිකව රු.15,000 බැගින් මාස 06 ක් සඳහා දරන ලද රු.90,000 ක අතිරේක පිරිවැයේ විධිමත් බවක් විගණනයට තහවුරු නොවිය.

(ඉ) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය හා ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය මගින් සංවිධානය කරනු ලැබූ 'මහාභිමානී' ජාතික ත්‍යාග ප්‍රදාන උත්සවය සඳහා පිහිටුවා ගන්නා ලද මහාභිමානි සංගමය වෙත සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලින් රු. 5,000,000 ක් ගෙවා තිබූ අතර එම මුදල ප්‍රවාරණ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණද අරමුදලින් එවැනි වියදමක් දැරීමේ අවශ්‍යතාවයක් සහ ඉන් අරමුදලට වූ ප්‍රතිලාභයක් විගණනයේ දී සනාථ නොවිණි. මෙම කරුණ සඳහාම ඉකුත් වර්ෂයේදී ද රු.2,500,000 ක මුදලක් ලබාදී තිබුණි.

(ඊ) රජයේ අනුමත වැටුප් වැඩිවීමක් හෝ භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නිලධාරීන් තිදෙනෙකු සඳහා මාසිකව රු.30,000 ක්, රු.5,700 ක් හා රු.3,500 ක් වශයෙන් සියයට 05 සිට සියයට 43 ක පරාසයක් තුළ වැටුප් වැඩිකර තිබුණි.

(උ) කාර්ය පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරීන් සඳහා ගමන් කළ දුර හා ගෙවූ ගාස්තු පදනම් කරගෙන දරන ලද වියදම් ප්‍රතිපූර්ණය නොකර මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුල දී ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.1,480,000 ක් විය.

(ඌ) මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ පිළිබඳව සලකා බැලීමකින් තොරව මෙම ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පහත සඳහන් ගෙවීම් අනුමත කර තිබුණි.

(i) අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති නිලධාරීන් වෙත තම මාසික පාරිශ්‍රමිකයට අතිරේක වශයෙන් රු.2,621,518 ක දීමනා විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ii) එක් නිලධාරියෙකුට වසරකට රු.500,000 ක උපරිමයකට යටත්ව හදිසි අනතුරු සහ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් වූ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අංක 09/2013 දරන කළමනාකරණ මණ්ඩල තීරණය මගින් අවසර ලබාදී තිබුණි. මේ සඳහා විධිමත් ක්‍රියාපරිපාටියක්ද නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී නිලධාරීන්ගේ වෛද්‍ය බිල්පත් පියවීම සඳහා අරමුදලින් රු.1,154,370 ක් ගෙවා තිබුණි.

(iii) නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඇගැයීමකින් තොරව විවිධ රේටයන් යටතේ එකතුව රු.1,724,480 ක දිරිගැන්වීමේ දීමනාවක් ලෙස වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් ගිණුමේ පවතින අතිරික්තය පදනම් කර ගනිමින් ඉහතින් සඳහන් දිරි දීමනා ගෙවීමට අමතරව ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලෙහි නිලධාරීන් වෙත රු.985,500 ක කාර්යක්ෂමතා දීමනාවක් සහ එහි ගිණුම් කටයුතු ඉටු කිරීම වෙනුවෙන් සේවා සපයන ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනයේ ගිණුම් අංශයේ නිලධාරීන් වෙත රු.65,521 ක කාර්යක්ෂමතා දීමනාවක් ගෙවා තිබුණි.

(v) ලබා නොගත් නිවාඩු දින 21 වෙනුවෙන් අරමුදලේ නිලධාරීන් තිදෙනෙකුට රු.352,642 ක් ගෙවා තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද නිලධාරීන්ගේ එදිනෙදා පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් මනා පාලනයක්ද එක් එක් නිලධාරියා වෙත කාර්යසාධන ඉලක්ක ලබා දීමක් ද විගණනයේ දී නිරීක්ෂණය නොවුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 ජූලි 08 දිනැති අංක PED/PU දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව හා 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත ආයතන විසින් සිය සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු වන අතර බඳවාගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටි, සේවක සංඛ්‍යාව සහ වැටුප් පරිමාණ සංශෝධනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු නමුත් අරමුදල විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් 05 දෙනෙකුගෙන් හා කාර්ය පැවරුම් පදනම මත බඳවා ගත් නිලධාරීන් 33 දෙනෙකුගෙන් අරමුදල පවත්වාගෙන යනු ලබන බැවින් එහි කටයුතු සම්බන්ධයෙන් වගකීම් දැරීමට ස්ථිර කාර්ය මණ්ඩලයක් ඊට නොමැති විය.

(ඇ) කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන ඇති නිලධාරීන්ගේ සේවා කාලය කාර්ය පැවරුම් අනුව ඛණ්ඩනය නොකර අඛණ්ඩව වර්ෂ 01 සිට 15 දක්වා කාලයක් සේවය ලබාගෙන තිබුණි. එසේම ඔවුන්ට කාර්ය පැවරුම් මත ගෙවීම් කිරීම වෙනුවට මාසික වැටුපක් ගෙවා තිබුණි. මෙයින් අඛණ්ඩ සේවා කාලය වර්ෂ 03 ඉක්ම වූ නිලධාරීන් 20 ක් විය. මේ හේතුවෙන් කාර්ය පැවරුම් මත බඳවා ගත් නිලධාරීන්ට අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ජීවන වියදම් දීමනා, දිරි දීමනා ආදිය ගෙවීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, ජීවන වියදම් දීමනා, දිරි දීමනා හා ප්‍රවාහන දීමනා වශයෙන් රු.5,686,905 ක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

----------------------

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ කටයුතු සහ ගනුදෙනු අරමුදල මගින් හෝ අමාත්‍යාංශය මගින් අභ්‍යන්තර විගණනයකට ලක් කර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

---------------

අරමුදල ආරම්භක අවස්ථාවේ සිටම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. තවද අරමුදලේ නිලධාරීන් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලටද කැඳවා නොතිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) සේවක කළමනාකරණය

(ආ) මූල්‍ය කළමනාකරණය